# 11 grade සාහිත්‍ය රසාස්වාදය 1 පත්‍රය

01.

1. (අ) සීලවතී බිසව
   (ආ) කුස රජුට

2. (අ) සුද්දෝදන රජු
   (ආ) බුදුරජාණන් වහන්සේට

3. (අ) ඉයෝනා නිලධාරි
   (ආ) ඇන්තන් පවුලොව් චෙකෝෆ්

4. (අ) සහස්පත - නෙළුම් මල
   (ආ) මුවරද - මල් පැණි

   මිනිසුන් තුළ හොඳ ගුණ හා නරක ගුණ ඇත. නිර්දෝෂී කෙනෙක් මේ ලෝකේ ඉපදී නැත විශිෂ්ට සිනිඳු මල් පැණි වලින් බරවූ නෙළුම්මලෙහි උවද නටුව කටු වලින් යුක්ත වේ.

5. විමලරත්න කුමාරගම
   සුන්දරහාමි.

02. ශක්‍ර දේවේන්ද්‍ර විලාසයෙන්

i. දිවි දළෙන් ඔප් නගා කරන ලද ස්වර්ණ ප්‍රතිමාවක් මෙන්

ii. මාමණ්ඩි නුඹ වහන්සේට විරුද්ධව ඇවිදින් වටලා ගත් සතුරු සේනාව පණ පිටින් අල්ලාගෙන ආවෙමි.

iii. ප්‍රභාවාතී කුමරියන්ගේ නංගිලා

iv. නුඹ වහන්සේගේ දූ දූන් සත්දෙනා මේ රජ දරුවන්ට පාවා දී මේ අය බෑනාවරු කර ගන්නා ලෙස

නැතහොත්

i. ජී.බී.සේනානායක

ii. අනුප්‍රාසය

iii. හිස නමා ගති ඇ
සිතින් රතැගිලි පටලවාගනි.

ඔබයනු මොබ යනු
පටපිළි ගෙන අබරණ පෙට්ටි ගෙන
ඇසෙයි පෙනෙන විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට

Iv. හෙළන සුස්මෙන් සුවඳය එ
ඇ බඳ සුවඳ

## II පත්‍රය

**පිළිතුරු පත්‍රය**

(අ)මෙම පැදි පෙළට පාදක වී ඇත්තේ රාත්‍රිය නිමාවී හිරු උදාවන අවස්ථාව පිළිබඳ අත්දැකීමකි.

උදා: " පෙරදිග ගොරහැඩි රකුසෝ
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදාගන්න පොරවාගත්ත
කලු රෙදි පොට
මොකට ද මේ
තීරුවලට ඉරා දමන්නේ"

හිරු උදාවත් සමඟ සිදුවන කුරුල්ලන්ගේ හැසිරීම් රටාව

උදා:"කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳටම බිය කරලා"

හිරු උදාවත් සමඟ අජීවී පරිසරයේ සිදුවන සිදුවීම්.

"මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුළු සලනවා "
වැනි උදාහරණ

අත්දැකීම් විස්තර කිරීම (ලකුණු 4)
උදාහරණ (ලකුණු 2)
(ලකුණු 4+2=6)

(ආ)උදා:රාත්‍රිය නිමා වී හිරු උදා වීම සුලබ අත්දැකීමකි.එහෙත් සිරිගුනසිංහයන් එය දකින්නේ අපූර්වාකාරයෙනි.

"නිදාගන්න පොරවාගත්ත
කලු රෙදි පොට
මොකට ද මේ
තීරුවලට ඉරා දමන්නේ"

හිරු උදාවත් සමඟ ඇසෙන කුරුලු නද කවියා දකින්නේ වෙනස්ම ආකාරයෙනි.

"කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳටම බය කරලා"

හිරු උදාව අවදි වී නව දවස පිළිගැනීමට
සූදානම් විය යුතු උව ද යළිත් කතකයා නින්දට ලොබ බඳියි.

"ඇස් දෙක මම අරින්නෙ නෑ "

(ඉ)*නිසදැස් හෙවත් නිදහස් ආකෘතිය
නිදාගන්න පොරොවාගත්ත
කලු රෙදි පොට

*ප්‍රබල ලෙස සිය අදහස් ඉදිරිපත් කිරීමට නිසදැස් ආකෘතිය ඉවහල් කර ගනී.
*එළිසම විරහිත වුව ද කියවීමේ දී රිද්මානුකූල බවක් දක්නට ලැබේ.
පෙරදිග ගොරහැඩි රකුසෝ
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ ......

(ඊ)භාෂාව නව්‍ය වූ සංකල්ප රූපවලින් පොහොසත්ය.ව්‍යංග්‍යාර්ථවත්ය. "හිරු " හෙවත් සූර්යා හඳුන්වන්නේ "පෙරදිග ගොරහැඩි රකුසෝ "යනුවෙනි.

අඳුර - කලු රෙදි පොට

හිරු උදාවත් සමඟ මල් පිබිදෙද් දී ඒ මත වූ පිනි විසිරීම දක්වන්නේ

" මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුළු සලනවා "යනුවෙනි.

(උ)මෙම පද්‍ය පන්තියේ සාර්ථකත්වයට කවියා උපයුක්ත කරගනු ලබන භාෂාව හේතු වී ඇත.සංකල්ප රූපවලින් යුතුය.

එමෙන්ම හිරු උදාව හා අඳුර නිමා වීම යන සිද්ධි අපූර්ව ආකාරයෙන් ගෙනහැර දක්වයි.එය නව්‍යතම සංකල්පනාවකි.
සංක්ෂිප්තතාව ද වැදගත්ය.

02).නන්ද කුමරු ජනපද කල්‍යාණිය පිළිබඳ සිතින් අත් නොහැර ඈ ගැනම සිතමින් සිවුරු හරින්නට සිතීම.
"මා ශාසනාභිරති ඇලුම් නැත. සිවුරු හරිමි යි... "

බුදුන්වහන්සේ නන්ද තෙරුන් හා දෙව්ලොව වඩිනා ගමන

...... තව්තිසා දෙව්ලොවට වඩිනා සේක් අතරමඟ නවදැලි හේනක් මවාලා ඒ සේනේ දා ගිය කණුවෙක දා වක ගැසී ගිය වැදිරිමහල්ලක මවාලා.....

එහි එන අතීත කතාව වන කප්පට වෙළෙන්දාගේ කොටළුවා හා සම්බන්ධ කතාවේ සිද්ධි දාමය

කොටළුවා කොටළු දෙනක දැක ඈ හා සාමීචි යෙදෙන අවසථාව.

".....ඒ වන්නා මෙතෙක් තැන් නිකමුත් නොව බර උසුලාගෙන යව.ගිය තැන ගමන් ඇවිදින පය මිරිකන කෙනෙක් ඇද්ද.,නැද්දැයි යි ඊට පිටලා අනික් විතාරණ දෙයක් විචාළීය.

*කෙලෙස් නමැති අකුසලින් දුරුව භාවනා කොට නිවන් ලැබීමේ ආනිසංශ ඉදිරිපත් කරයි.

*නවදැලි හේනේ වැදිරියක්,ජනපද කල්‍යානිය හා දෙවඟනක් අතර කරන සංසන්දනය.

*කොටළුවා කොටළු දෙන පිළිබඳ සිත් ඇති වීම ආදී නිදසුන්.

03).උචිත ලෙස පද භාවිතයෙන් රසය තිව්‍ර කරයි.

"උදේ සිට ඇඳ හැළෙන...."
"ගොහොරු මඩ ඇඟිලි කරු අතර චිරි චිරි ගාන...."
"තෙමුණ රෙදි ඇඟ ඇලුණ... "

වර්ෂාව අවස්ථාවක සිදුවන සංසිද්ධි හා වර්ෂාවට මුහුණ දුන් කෙනෙකුගේ සිත තුළ ඇති වන මනෝභාවයන්
සංකල්ප රූප බහුල භාෂාවක් යොදා ගනී
"මඩ කඩිති හැම තැනම...."
"වක්කලන් ඇළි හැදුණ...."
"කාර් රෝදෙන් විරිස් ඇඟපුරා මඩ ඉහෙන...."

රිද්මානුකූල යෙදුම් යොදා ගැනීම
"චිචිරි චිරි චිචිරි චිරි..."
"වහින වැහි වහින වැහි..."

එක් උදා: ලකුණු (2*3=6)
විග්‍රහයට: ලකුණු (2*3=6)
භාෂා නිරවද්‍යතාව ලකුණු 2
නියමිත වචන සංඛ්‍යාව(වචන 150) සහිතව ලකුණු 1
(මුළු ලකුණු 15)

04).ඉයෝනා නමැති අශ්ව කරත්ත කරුවා හමුදා නිලධාරීන් සිය කරත්තයේ නංවාගෙන යන අතරමග දී නිරන්තරයෙන් ඔහුට තම මිය ගිය පුතු සිහිපත් වීම නිසා ඔහු පත්වන මානසික ගැටුම.
උදා:"ඉයෝනා නිලධාරියා දෙසට හැරී තොල් මතුරයි.ඔහුට කිසිවක් කීමට උවමනා බව පැහැදිලි කරුණකි.එහෙත් ඔහුට පිට කළ හැකි වූයේ සුසුමක් පමණි "
"ඉයෝනා විරිත්තමින් සිනාසී......"
"මගේ පුතා මේ සුමානේ මැරුණා....."

"හ්ම්! මොනවා වෙලාද මැරුණේ..."
පාරේ ගමන් කරන අනෙකුත් මිනිසුන් ඔහුට පරිහව කරන ආකාරය.
"බලාගෙන පලයන් යකෝ," යි අඳුරෙන් හඬ නැගෙයි."උඹ මැරිල ද බොල නාකියෝ.....?පාර බලාගෙන පලයන්."

ඔහුගේ චිත්ත සන්තාපය කිසිවෙකු නොදනී.නොහඳුනයි.
නිලධාරීන් ඉයෝනාට පරිහව කරන ආකාරය.
"නාකිරාළ, උඹේ තොප්පියේ හැටි.මුළු පීටර්ස්බර්ග් නුවර ම නෑ ඔච්චර කබල් තොප්පියක් හොයා ගන්න...!"
"ඉහි...ඉහි..ඉහි.... යි ඉයෝනා විරිත්තයි.මෙහෙම...."
ඉයෝනා දැඩි සිත් වේදනාවකින් පෙළුණද ඒ පිළිබඳ රියෙහි ගමන් කරන නිලධාරීන්ට හැඟීමක් නැත.
"ඇ මිනිහො උඹ කසාද බැඳල ද?"
"මම?ඉහි,ඉහි .....මට දැන් ඇත්තේ මගේ ගැනිත් තෙත පොළවත් විතරයි....."
අවසානයේ ඉයෝනා සිය දුක්බර කතාව කියන්නේ අශ්වයාටය.
"......හිතපන්,ඔන්න උඹට පොඩි පැටියෙක් හිටියා ,ඒ පැටියගෙ අම්මා උඹයි.ඌ හිටි හැටියෙ උඹව තනි කරලා උඹව අතැරලා ගියා.ඒක දුකයි,නොවෙද බොල?"
කිසිම මනුෂ්‍යකු විසින් ඇහුම්කන් නොදුන් ඔහුගේ කතාව අශ්වයා අසාසිටී.එය හැඟීම්බරය.

නිදසුන්:(ලකුණු 2*3=6)
විග්‍රහයට:ලකුණු (2*3=6)
භාෂා නිරවද්‍යතාව: ලකුණු 2
නියමිත වචන සංඛ්‍යාව:ලකුණු 1
(මුළු ලකුණු 15)

05).ඇත්තු හා වන අලි තුළ වූ හොඳ ගුණාංග ප්‍රකාශ වන අවස්ථා
අම්මල කනකොට
වතුර නානකොට
තිප්පලේ නිදියන කොට වැටිලා

කැළේ මමලා
ඉඩ දී අයිනට
වෙලා ඉන්නවා
නොවැ රැකලා.

මිනිසාගේ නරක ගති ගැන කියවෙන අවස්ථා
මිනිසා කියනා
දෙපා සතාගේ
ළඟින් ගියත් ඇති
පොඩි පුතුනේ

ලෙහි පපු කම් නෑ
හරි ගතිගුණ නෑ
ඒ බව කවුරුත්
දන්නවනේ.

*ඇතින්නකට පැටියෙක් ලැබුණු විට රැලේ සියලුම ඇතින්නියන්ට කිරි එරෙන සංසිද්ධිය.
"එක දරුවෙක් ඇති
වුණොත් රැළේ අපෙ
කාටත් කිරි එරි
ලා එනවා

වෙනස් කමක් නෑ
එක සෙනෙහසමයි
කාගෙත් දරුවොයි
සැලකෙනවා...."

*මිනිස්සු තම උවමනාවන් සාක්ෂාත් කරගන්නා ආකාරය හා එහි දී ඔවුන් ක්‍රියා කරන ආකාරය.
බුද්දන් සරණයි
දෙයියන් සරණයි
තව තව ගස් ගස්
වල සරණයි

ගහගෙන බැරිවුණු
තැන මිනිසුන්හට
චී!චී! ගතිගුණ
ඩුවෙ සරණයි

මිනිසුන්ගෙ පහත් මානසිකත්වය විවරණය කිරීම
බුදු සරණෙන් මදි
දෙවි සරණෙත් මදි
මයිල් ගහේ සර
ණෙත් පතතී.